# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1981 අංක 70 දරන
# ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය
# (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


**පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

1981 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලෙ දී ලබාගත හැක

මිල : ශත 45 යි — තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 70 දරන ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 38/81

**ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

සාමාජිකයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත වූ "ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති වලට අනුකූලව, ඒ සමිතියට සම්බන්ධ සියලු කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද : — පූර්විකාව.

ඒ සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 70 දරන ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු, මෙහි උපලේඛනයෙහි නම් සඳහන්ව ඇත්තා වූ ද (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානයේ වර්තමාන සාමාජිකයන් වන්නා වූ ද තැනැත්තන් සහ මෙහි මින් මතු දක්වා ඇති විධිවිධානවල සඳහන් ආකාරයට තෝරා පත් කර ගනු ලබන ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන්, "ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය" යන නාමය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු ය. තවද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලතල හා අධිකාරය එයට ඇත්තේ ය. — ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— — සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පොත්පත්, ප්‍රකාශන, ශබ්ද වාහිනී තැටි, ශ්‍රව්‍ය හා දෘශ්‍ය පටි සහ වෙනත් මාධ්‍යයන් මගින් ජේ. ක්‍රිෂ්ණමූර්තිගේ ඉගැන්වීම් මහජනයාට ලබා ගැනීමට සැලැස්වීම ;

(ආ) ජේ. ක්‍රිෂ්ණමූර්තිගේ පොත්පත් ජාතික භාෂාවලට පරිවර්තනය කිරීම සහ ඒ පොත්පත් හෝ ඒවායේ පරිවර්තන සංස්කරණය කිරීම හෝ පළ කිරීම ;

(ඇ) ජේ. ක්‍රිෂ්ණමූර්ති ලවා දේශන සහ සාකච්ඡා පැවැත්වීම සඳහා අවශ්‍ය සියලු කටයුතු පිළියෙළ කිරීම ;

# 1981 අංක 70 දරන ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 38/81

**ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

සාමාජිකයන් එකොළෙස් දෙනකුගෙන් සමන්විත වූ "ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති වලට අනුකූලව, ඒ සමිතියට සම්බන්ධ සියලු කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද :

ඒ සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1981 අංක 70 දරන ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු, මෙහි උපලේඛන යෙහි නම් සඳහන්ව ඇත්තා වූ ද (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථා නයේ වර්තමාන සාමාජිකයන් වන්නා වූ ද තැනැත්තන් සහ මෙහි මින් මතු දක්වා ඇති විධිවිධානවල සඳහන් ආකාරයට තෝරා පත් කර ගනු ලබන ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන්, "ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය" යන නාමය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු ය. තවද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලතල හා අධිකාරය එයට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) පොත්පත්, ප්‍රකාශන, ශබ්ද වාහිනී තැටි, ශ්‍රව්‍ය හා දෘශ්‍ය පටි සහ වෙනත් මාධ්‍යයන් මගින් ජේ. ක්‍රිෂ්ණමූර්තිගේ ඉගැන්වීම් මහජනයාට ලබා ගැනීමට සැලැස්වීම ;

(ආ) ජේ. ක්‍රිෂ්ණමූර්තිගේ පොත්පත් ජාතික භාෂාවලට පරිවර්තනය කිරීම සහ ඒ පොත්පත් හෝ ඒවායේ පරිවර්තන සංස්කරණය කිරීම හෝ පළ කිරීම ;

(ඇ) ජේ. ක්‍රිෂ්ණමූර්ති ලවා දේශන සහ සාකච්ඡා පැවැත්වීම සඳහා අවශ්‍ය සියලු කටයුතු පිළියෙළ කිරීම ;

(ඇ) සංස්ථාවේ කටයුතු සඳහා සුදුසු වූ ඉඩකඩ ඇති භූමි භාගයක් හා ගොඩනැගිලි පහසුකම් සහිත ස්ථානයක් රැස වීම් සඳහා පිහිටුවා පවත්වා ගෙන යාම ;

(ඉ) ජේ. ක්‍රිෂ්ණමූර්තිගේ ඉගැන්වීම්වලට අනුකූල වූ අධ්‍යාපනික කටයුතු භාර ගැනීම සහ ඒවාට ආධාර දීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන්, ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ අවශ්‍ය විය හැකි හෝ ඊට හිතකර හෝ ආනුෂංගික වෙනත් දේ කිරීම හෝ කිරීමට සැලැස් වීම.

සංස්ථාවේ සාමාජිකත්වය.

4. (1) සංස්ථාව සාමාජිකයන් එකොළොස් දෙනකුගෙන් පමණක් සමන්විත විය යුතු ය.

(2) සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම, අශක්නුතාව හෝ ඉවත් කරනු ලැබීම හේතු කොට ගෙන සංස්ථාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් සංස්ථාවේ ශේෂව සිටින සාමාජික යන් විසින් එක් මසක් ඇතුළත දී අලුත් සාමාජිකයකු තෝරා පත් කර ගැනීමෙන් ඒ පුරප්පාඩුව පිරවිය යුතුය.

(3) යටත් පිරිසෙයින් සාමාජිකයන් හත්දෙනකු විසින් අත්සන් කරනු ලැබූ ලිඛිත ඉල්ලීමක්, යථා පරිදි කැඳවනු ලැබූ ද ඒ ඉල්ලීමට අත්සන් තැබූ සියලු දෙනා පැමිණ සිටිය යුතු වූ ද සංස්ථාවේ රැස් වීමක දී කියවීමෙන්, සංස්ථාවේ යම් සාමාජිකයකු සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ නිලධරයෝ.

5. (1) සංස්ථාවේ තත් කාලයෙහි වලංගුව පවත්නා රීතිවලට අනුකූලව සභාපතිවරයකු, ලේකම්වරයකු සහ භාණ්ඩාගාරිකවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය ; නැතහොත් පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේදී මධ්‍යස් ථානයේ නිල දැරූ නිලධරයෝ සංස්ථාවේ ප්‍රථම නිලධරයෝ විය යුත්තාහ.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

6. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ආධාර හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස් ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් එක් පරමාර්ථයක් හෝ වැඩි දියුණු කිරීම හෝ හැසිරවීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියාවන් කිරීමේත් සියලු කරුණු ඉටු කිරීමේත් සියලු දේ ක්‍රියාත්මක කිරීමේත් බලය සංස්ථාවට අත්තේ ය.

7. (1) පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා අවිස්ථානුරූප යයි සංස්ථාව විසින් සලකනු ලබන්නා වූ ද මේ පනතට අනනුකූල නොවන්නා වූ ද රීති, තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලැබූ රැස්වීමක දී යටත් පිරිසෙයින් සාමාජිකයන් හත්දෙනකුගේ ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබිය හැකි ය:— සංස්ථාවේ රීති.

(අ) සංස්ථාවේ සාමාජිකයන්ගේ බලතල, හැසිරීම සහ කාර්ය ;

(ආ) සංස්ථාවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය සහ, ඒ රැස්වීම් පැවැත්විය යුතු වේලාවල්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒ රැස්වීම් වල න්‍යාය පත්‍ර සහ ඒ රැස්වීම්වල දී කළයුතු කටයුතු යනාදිය පිළිබඳ කාර්ය පරිපාටිය ;

(ඇ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(ඈ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

එවැනි රීති සෑදීමෙන් පසු, යට කී ආකාරයේම වූ රැස්වීමක දී ඒ හා සමාන ආකාරයෙන් ඒ රීති වෙනස් කිරීම, ඒවාට අලුතින් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

8. මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ එවකට බලපවත්නා රීතිවලට යටත්ව ද ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව ද සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ**

9. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විටක, එහි සියලුම ණය සහ බැරකම් ගෙවා පියවීමෙන් පසු, කවර හෝ දේපළක් ඉතිරි වේ නම්, ඒ දෙ පළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම ස්වකීය රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේදැයි සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

10. සභාපතිවරයාගේ ද භාණ්ඩාගාරිකවරයාගේ හෝ සංස්ථාවේ වෙනත් යම් සාමාජිකයකුගේ ද ඉදිරියේ දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් විසින් තම නම් ඒ සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය. තවද එසේ අත්සන් කිරීම, සාක්ෂි කරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතුය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

උපලේඛනය [2 වන වගන්තිය]

1. ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් (සභාපති)
2. ඩබ්ලිව්. එච්. බෝධිදාස මහතා
3. ශ්‍රීමතී බෝධිදාස මහත්මිය
4. ඩබ්ලිව්. ඊවන් ජේපාන්සේකා මහතා (ලේකම්)
5. ජේ. පී. ගුණවර්ධන මහතා
6. අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහත්මිය
7. ආචාර්ය කේ. ජිනදාස පෙරේරා (භාණ්ඩාගාරික)
8. පී. රාසනායගම් මහතා
9. සී. ෂන්මුගනායගම් මහතා
10. එච්. පී. සිරිවර්ධන මහතා
11. ශීලා සිරිවර්ධන මහත්මිය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 60 කි. (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.